මගේ අංකය - JSC/SEC/CIR-L/2025

සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

**රක්ෂිත බන්ධනාගාර ගතකර ඇති සැකකරුවන් සහ සිරදඬුවම් විඳින සිරකරුවන් සම්බන්ධයෙන් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ අධිකරණ නියෝග නිකුත්කිරීම .**

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති 2012.05.11 දිනැති අංක 344 දරණ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛය සියලුම අධිකරණ නිලධාරීන් වෙත නැවත නිකුත් කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව මා හට නියම කර ඇත.

02. ඒ අනුව, එහි සඳහන් කරුණු පිළිබඳව නැවත ඔබගේ අවධානය යොමු කරන ලෙස මෙයින් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝබර් මස 09 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

අධිකරණ සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ අංක - 344

මගේ අංකය - ජේඑස්සී/එස්ජ්සී/සීඅයිආර්/2011

සියළුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>රක්ෂිත බන්ධනාගාර ගතකර ඇති සැකකරුවන් සහ සිරදඬුවම් විඳින සිරකරුවන් සම්බන්ධයෙන් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ අධිකරණ නියෝග නිකුත්කිරීම</u>

සැකකරුවන් සහ සිරකරුවන් සම්බන්ධයෙන් අධිකරණ නියෝග නිකුත්කිරීමේදී මහේස්ත්‍රාත්වරුන් විසින් බන්ධනාගාර ආඥාපනතේ ප්‍රතිපාදන සහ එම ආඥාපනත යටතේ සකසා ඇති නියෝග සැලකිල්ලට ගත යුතුය.

සැකකරුවන් සහ සිරකරුවන් සම්බන්ධයෙන් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ මහේස්ත්‍රාත්වරුන් විසින් කරනු ලබන විශේෂිත වූ නියෝග වලට අනුව කටයුතු කිරීමේදී ප්‍රායෝගික දුෂ්කරතා රාශියකට මුහුණදීමට සිදුවන බව බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇති අතර ඒ පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව සැකකරුවන්ට සහ සිරකරුවන්ට අදාලව යම් යම් නියෝග නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකිරීමට තීරණය කර ඇත.

1. මහේස්ත්‍රාත්වරුන් විසින් යම් සැකකරුවකුට හෝ සිරකරුවකුට විශේෂ ආරක්ෂාව ලබාදෙන ලෙස නියෝග නොකල යුතු අතර, යම් සැකකරුවකු හෝ සිරකරුවකු විවෘත අධිකරණයේදී ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබුවහොත් එය අදාල බන්ධනාගාර අධිකාරීවරයාගේ අවධානයට ලක්කිරීම ප්‍රමාණවත්ය.

2. මහේස්ත්‍රාත්වරුන් විසින් යම් සැකකරුවකු හෝ සිරකරුවකු විශේෂ බන්ධනාගාරයක රඳවා තබන ලෙස නියෝග කිරීම නොකලයුතුය.

3. මහේස්ත්‍රාත්වරුන් විසින් කිසිදු සැකකරුවකු හෝ සිරකරුවකු බන්ධනාගාර ගතව සිටින කාලය තුල ඔවුන්ගේ පවුල්වල විශේෂ අවස්ථාවන්ට සහභාගී වීමට හෝ වෙනත් යම් කටයුත්තකට බන්ධනාගාරය මගින් ඔවුන්ගේ නිවෙස්වලට හෝ වෙනත් ස්ථානයකට රැගෙන යන ලෙස නියෝග නොකලයුතු අතර සමීප ලේ ඥාතීන්ගේ අවමඟුල් අවස්ථාවන් වලදීද බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියෝග හා රෙගුලාසි වලට අනුව එම සැකකරුවන් සහ සිරකරුවන් අවශ්‍ය ස්ථානවලට රැගෙන යාම බන්ධනාගාර අධිකාරීවරයාගේ මෙහෙයවීම මත සිදුකෙරෙනු ඇත.

4. සැකකරුවකු හෝ සිරකරුවකු කවර හේතුවක් මත හෝ බන්ධනාගාරයෙන් බැහැරට රැගෙන යන ලදහොත් ඒ බව සහ ඊට හේතු වූ කරුණු අදාල බන්ධනාගාර අධිකාරී විසින් මහේස්ත්‍රාත්වරයාට වාර්තා කරනු ඇත.

5. ඊට අමතරව සැකකරුවන් හෝ සිරකරුවන් වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන මෙන් ඉල්ලීම කරනු ලබන අවස්ථාවන්හිදී එම ඉල්ලීම බන්ධනාගාර වෛද්‍යවරයා වෙත යොමුකල යුතුය.

උක්ත කරුණ පිළිබඳ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2009.06.05 දිනැති අංක.320 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

මංජුල තිලකරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

2012 මැයි මස 11 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.